# ශ්‍රී ලාංකීය පාසල් 21 වන සියවසේ අධ්‍යාපනය වෙත ගෙන යාම අරමුණු කර ක්‍රියාවට නඟන මානව සම්පත් සංවර්ධන වැඩසටහන
# Human Resource Development Programme to take Sri Lankan Schools to 21st Century Education

**සැසිය 10 (Session 10)**

**පුනරීක්ෂණය හා විදුහල්පතිත්ව පාඨමාලා හා සම්බන්ධ අරමුණු ප්‍රකාශන**

**පුනරීක්ෂණය**

1. ළමුන් ඉගෙනගන්නා ආකාරය, වැඩිහිටියන් ඉගෙනගන්නා ආකාරයෙන් වෙන් කර දැක්වීම සඳහා යොදාගන්නා පද මොනවා ද?
   - ළමා අධ්‍යාපන ක්‍රමවේද (Pedagogy) / වැඩිහිටි අධ්‍යාපන ක්‍රමවේද (Andragogy)
   - ළමුන් ඉගෙනගන්නා විද්‍යාව නැත්නම් කලාව හැඳින්වීම සඳහා යොදා ගන්නා **ශික්ෂණවිද්‍යාව** ද Pedagogy ලෙස හැඳින්වෙයි.
   - ක්‍රමවිද්‍යාව (Methodology) → ක්‍රම (Methods) → ක්‍රමශිල්ප (Techniques)
   - ක්‍රමවිද්‍යාව හා ක්‍රම අතරට පැමිණ තිබෙන **උපායමාර්ග (Strategies)**, ක්‍රමවිද්‍යාවට අදාළ ඉගෙනුම් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යොදා ගන්නා පොදු සැලැස්මක් හෝ එළඹුමක් ලෙස හැඳින්වෙයි. Refer Session 6 for details

2. **විෂයමාලා කළමනාකරණය** (Curriculum Management) යන්නෙහි අර්ථය කුමක් ද?
   - ජාතික මට්ටමින් සකස් කරනු ලබන පාසල් විෂයමාලා **මනා නියාමනයක් (Monitoring)** යටතේ පාසල් මට්ටමේ සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සඳහා දරන උත්සාහයක්
   - ගුණාත්මක ඉගෙනුම් පල (Quality Learning Outcomes) සාක්ෂාත් කර ගැනීම සඳහා දරන වෑයමක්
3. පාසල් මට්ටමේ විෂයමාලා කළමනාකරණය සඳහා දායක වන පිරිස හඳුන්වා දෙන්නේ කෙසේ ද?
   පාසලක ශාස්ත්‍රීය කටයුතු සංවර්ධනය සඳහා නන් අයුරින් දායක වන විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති (සංවර්ධන), අංශ ප්‍රධාන (Sectional Heads), විෂය ප්‍රධාන (Subject Heads), පන්ති මට්ටමේ විෂය නායකයින් (Subject Leaders) වැනි පිරිස්

4. පාසලක පරිපාලන කටයුතුවලට දායක වන්නේ කවුරුන් ද?
   විදුහල්පති, නියෝජ්‍ය විදුහල්පති (පරිපාලන), අංශ ප්‍රධාන, ශ්‍රේණි ප්‍රධාන (Grade/Year Heads), ශිෂ්‍ය නායකයින් (Prefects), හා පන්ති නායකයින් (Monitors)

5. මූලික හා උසස් විදුහල්පතිත්ව පාඨමාලා (Basic and Advanced Principalship Programmes), විෂයමාලා අරමුණු තීරණය කිරීමටත් එම අරමුණු සාක්ෂාත් වූ මට්ටම් හඳුනා ගැනීමටත් කටයුතු කර ඇත්තේ කෙසේ ද?
   - පහත සඳහන් ආකාරයට **නිපුණතා වසම් (Competency Domains)** හතරක් හඳුනාගැනීමෙන්
     1.ගුණාත්මක පාසල් පාලනය (Quality School Governance) විචාරවත් (Rational)
     2.ධනාත්මක පාසල් පරිසරය (Positive Learning Environment)

3.සඵලදායි පාසල් **කළමනාකරණය** (Effective School Management)

4.ගුණාත්මක **ඉගෙනුම් පල (Quality Learning Outcomes)**

- ඒ ඒ නිපුණතා වසම යටතේ **නිපුණතා ක්ෂේත්‍ර (Competency Areas)** හතර බැගින් හඳුනාගැනීමෙන්

 **නිපුණතා වසම** 4 (Competency Domain 4): ගුණාත්මක ඉගෙනුම් පල

 **නිපුණතා ක්ෂේත්‍ර** (Competency Areas 4.1 to 4.4)

 4.1 විෂයමාලා ක්‍රියාත්මක කිරීම හා **නියාමනය** (Curriculum Implementation and Monitoring)

 4.2 ඉගැන්වීම හා ඉගෙනුම - ඉගෙනුම හා ඉගැන්වීම (Learning and Teaching)

 4.3 තක්සේරුකරණය හා ඇගයීම - තක්සේරුව හා ඇගයීම (Evaluation for Learning and Evaluation of Learning)

 4.4 ගුරු වෘත්තීය සංවර්ධනය (Teacher Professional Development)

6. තක්සේරුව හා ඇගයීම (Assessment and Evaluation) අතර වෙනස ඔබ පෙන්වා දෙන්නේ කෙසේ ද?
 තක්සේරුව - සිසුන් ඉගෙනගන්නා අවස්ථාවේ දී සිසු ඉගෙනුම සඳහා ලබා දෙන සහායකි.
 ඇගයීම - සිසු ඉගෙනුම අවසන් වූ පසු ඔවුන් ඉගෙනගෙන ඇති මට්ටම් හඳුනාගැනීමකි.

7. සිසුන් ඇගයීම සඳහා යොදා ගන්නා ශිෂ්‍ය කාර්ය සාධන ලිපිගොනු / ශිෂ්‍ය කාර්ය සංග්‍රහ (Student Portfolios) ඔබ හඳුන්වා දෙන්නේ කෙසේ ද?
 දෙන ලද කාල පරාසයක් තුළ සිසුවෙකු විසින් අත්පත් කර ගෙන තිබෙන ඉගෙනුම (දැනුම, ආකල්ප හා කුසලතා - නිපුණතා), සම්පූර්ණ කර තිබෙන වෘත්තීය සංවර්ධන අවශ්‍යතා, වෙනත් සාක්ෂාත්කරණ (achievements), ඔහු/ඇය විසින් තබන ලද ප්‍රත්‍යවේක්ෂණ සටහන් (reflective notes) වැනි කාරණා ද ඇතුළත් කරමින් අර්ථවත් පරිදි සංවිධානය කර තිබෙන **සාක්ෂි එකතුවක්** (collection of evidence)

8. මේ වන විට ඔබ හඳුනාගෙන තිබෙන නිපුණතා ක්ෂේත්‍ර හතර, මතු දැක්වෙන විදුහල්පති නිපුණතාවලින් වෙනස් වන ආකාරය ඔබ පෙන්වා දෙන්නේ කෙසේ ද?

 නිපුණතාව 4.1 - නිසි නියාමනයක් යටතේ පාසල් විෂයමාලා සාර්ථක ව ක්‍රියාත්මක කරයි.

 **නිපුණතාව 4.2 -** ගුණාත්මක ඉගෙනුමක් සඳහා අත්‍යවශ්‍ය **ශික්ෂණවිද්‍යාත්මක ප්‍රවේශ** (Pedagogical Approaches) යොදා ගනිමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියවලිය මෙහෙයවීම සඳහා ගුරුවරුන් යොමු කරයි.

 නිපුණතාව 4.3 - තක්සේරු හා ඇගයීම් ක්‍රමපිළිවෙත් ක්‍රියාවට නගමින් සිසු ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීම සඳහා ගුරුවරුන් සූදානම් කරයි.

 නිපුණතාව 4.4 - **ඉගෙනුම්-ඉගැන්වීම්-තක්සේරු-ඇගයීම් ක්‍රියාවලිය** මැනවින් හැසිරවීම සඳහා අඛණ්ඩ වෘත්තීය සංවර්ධන අවස්ථා ගුරුවරුන්ට සපයයි.

9. ඒ ඒ නිපුණතා ක්ෂේත්‍රය යටතේ **ප්‍රමිති** (Standards) හතර බැගින් හඳුනා ගෙන ඇත්තේ කෙසේ ද?

 **නිපුණතා ක්ෂේත්‍රය 4.2 - ඉගෙනුම හා ඉගැන්වීම**

4.2.1 ගුණාත්මක **ශික්ෂණවිද්‍යාව** (Pedagogy) පාසල පුරා ප්‍රවධර්නය කළ හැකි **සඵලදායි පරිසර ගොඩනැඟීම** සඳහා පාසල් ප්‍රජාව උනන්දු කරයි. (Pedagogy Vs. Andragogy)

4.2.2 සියලු ම ගුරුවරුන් **සඵලදායි ඉගෙනුම්-ඉගැන්වීම් සැලසුම්** සකස් කර ක්‍රියාවට නංවන බව තහවුරු කිරීම සඳහා නියාමන කටයුතු මෙහෙයවයි.

4.2.3 සියලු ම පන්තිකාමරවල **ශිෂ්‍ය කේන්ද්‍රීය ශික්ෂණවිද්‍යාව** ක්‍රියාත්මක විය යුතු බව අවධාරණය කරමින් එසේ සිදු වන බව තහවුරු කරයි.

4.2.4 සිසුන් කෙරෙහි සැලකිලිමත් **(caring),** සිසුන්ට සහාය වන **(supporting),** ශක්තිමත් **(strong) ගුරු සිසු සම්බන්ධතා** උනන්දු කරමින් එම සබඳතා පාසල පුරා ප්‍රවධර්නය කරයි.

10. ප්‍රමිතිය 4.2.4 සඳහා ලකුණු ප්‍රධානය ඔබේ අවශ්‍යතාව යයි සිතා ඒ සඳහා ඔබ කටයුතු කරන ආකාරය පෙන්වා දෙන්න.

- පහත සඳහන් ආකාරයට ඒ ඒ ප්‍රමිතිය සඳහා **දශර්ක** හතර බැගින් හඳුනා ගැනීම
  - (අ) හැකි සෑම අවස්ථාවක ම සිසුන්ට ප්‍රශංසා ලබා දෙමින් සිසුන් දිරිමත් කරයි.
  - (ආ) දෛනික පාසල් පැමිණීම දුවර්ල සිසුන් කෙරෙහි විශේෂ අවධානය දක්වමින් ඒ අය පාසලින් ගිලිහීම වළක්වා ගැනිම සඳහා ගුරුවරුන් පෞද්ගලික ව වග වෙයි (Accountable).
  - (ඇ) සිසුන්ගේ ආරක්ෂාව කෙරෙහි ගුරුවරුන් සැබෑ උනන්දුවක් හා සැලකිල්ලක් දක්වයි.
  - (ඈ) පාසල් ඒම තමන්ට ප්‍රිය කායර්යක් බව සිසුන් ප්‍රකාශ කරනු නිතර ඇසෙන්නට ලැබෙයි.

- දශර්ක සඳහා ලකුණු ලබා දෙන ක්‍රමයක් තීරණය කිරීම
  - ප්‍රදශර්නය නොවේ (Not Evident - NE), සංවධර්නය අරඹා තිබේ (Developing – D), ප්‍රදශර්නය වේ (Evident -E) ලෙස **ලක්ෂ්‍ය තුනක පරිමාණයක්** (Three Point Scale) හඳුන්වා දීම
  - 00, 01 හෝ 02 වශයෙන් ඒ ඒ දශර්කය සඳහා ලකුණු ලබා දීම
  - දශර්ක හතර සඳහා ම ලබා ගත් ලකුණු ඒකාරාශි කරමින් ප්‍රමිතිය සඳහා ලකුණු තීරණය කිරීම

<u>නිපුණතා ප්‍රමිති සාක්ෂාත් වූ මට්ටම් සොයා බැලීම</u>

1. **චයර්ාත්මක හා භෞතික දශර්ක (Behavioural and Physical Indicators)** ගොඩ නැඟීම

ප්‍රමිතිය 4.2.1 : ගුණාත්මක ශික්ෂණවිද්‍යාව (Pedagogy) පාසල පුරා ප්‍රවධර්නය කළ හැකි **සඵලදායි පරිසර ගොඩනැඟීම** සඳහා පාසල් ප්‍රජාව උනන්දු කරයි.

**චයර්ාත්මක හා භෞතික දශර්ක**

(අ) පන්ති කාමර තුළ ද පාසල පුරා ද **විවිධත්වයෙන් යුතු සඵලදායි ඉගෙනුම් පරිසර** පවතී.

(ආ) පන්තිකාමර වාතාවරණය තුළ මෙන් ම ඉන් පරිබාහිරව ද ඉගෙනීම සඳහා සිසුන් උනන්දු කරයි.

(ඇ) ඉගෙනුම සඳහා සිසුන් ගත කරන කාලය (time on task) උපරිම කර ගැනීමේ අරමුණෙන් **ඉගෙනුම් පරිසර කළමනාකරණය** සඳහා ගුරුවරුන් යොමු කර ඇත.

(ඈ) සියලුම ඉගෙනුම් මධ්‍යස්ථානවලට (විද්‍යාගාර, ගණිතාගාර, තාක්ෂණාගාර, සම්පත්ගාර, පුස්තකාල) ප්‍රවේශ වන ස්ථානයන්හි කාලසටහන් ප්‍රදශර්නය කරමින් **පාසල සතු අධ්‍යාපනික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලැබීම** සඳහා ගුරුවරුන්ට අවස්ථාව සපයා ඇත.

2. ප්‍රමිතිය 4.2.1 සඳහා නිපුණතා ප්‍රමිතිය ගණනය කරන්නේ කෙසේ ද?

| **ප්‍රමිතිය 4.2.1:** ගුණාත්මක ශික්ෂණවිද්‍යාව (Pedagogy) පාසල පුරා ප්‍රවර්ධනය කළ හැකි **සඵලදායි පරිසර ගොඩනැඟීම** සඳහා පාසල් ප්‍රජාව උනන්දු කරයි. | | | |
|---|---|---|---|
| **වයර්ථාත්මක හා භෞතික දර්ශක** | **ප්‍රදර්ශනය නොවේ** | **සංවර්ධනය වේ** | **ප්‍රදර්ශනය වේ** |
| (අ) පන්ති කාමර තුළ ද පාසල පුරා ද **විවිධත්වයෙන් යුතු සඵලදායි ඉගෙනුම් පරිසර** ගොඩ නහා තිබේ. | | | |
| (ආ) පන්තිකාමර වාතාවරණය තුළ මෙන් ම ඉන් පරිබාහිරව ද ඉගෙනීම සඳහා සිසුන් උනන්දු කරයි. | | | |
| (ඇ)ඉගෙනුම සඳහා සිසුන් ගත කරන කාලය (time on task) උපරිම කර ගැනීමේ අරමුණෙන් **ඉගෙනුම් පරිසර කළමනාකරණය** සඳහා ගුරුවරුන් යොමු කර ඇත. | | | |
| (ඈ)සියලු ම ඉගෙනුම් පරිශ්‍රයන්ට ප්‍රවේශ වන ස්ථානයන්හි කාලසටහන් ප්‍රදර්ශනය කරමින් **පාසල සතු අධ්‍යාපනික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලැබීම** සඳහා ගුරුවරුන්ට අවස්ථාව සපයා ඇත. | | | |

| නිපුණතා ප්‍රමිතිය Competency Standard | ආරම්භක නිපුණතාව Beginning Competence (00-02) | සංවර්ධනය වන නිපුණතාව Developing Competence (03-04) | ඉහළ නිපුණතාව Advanced Competence (05-06) | විශිෂ්ට නිපුණතාව Expert Competence (07-08) |
|---|---|---|---|---|
| | | | | |

3. ප්‍රමිතිය 4.2.2 සඳහා නිපුණතා ප්‍රමිතිය ගණනය කරන්නේ කෙසේ ද?

| **ප්‍රමිතිය 4.2.2 :** සඵලදායි ඉගෙනුම්-ඉගැන්වීම් සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම ගුරුවරුන්ගේ සූදානම නිතිපතා නියාමනයට ලක් වෙයි. | | | |
|---|---|---|---|
| වයර්ථාත්මක හා භෞතික දර්ශක | ප්‍රදර්ශනය නොවේ | සංවර්ධනය වේ | ප්‍රදර්ශනය වේ |
| (අ) ලබා දී ඇති ආකෘති ප්‍රකාර ව ගුරුවරුන් වාර්ෂික වැඩ සැලසුම්, වාර සටහන් / ඒකක සැලසුම් හා ක්‍රියාකාරකම් **සැලසුම්** සකස් කර ඇත. | | | |
| (ආ) තකර්ානුකූල පදනමක් යොදාගෙන ගුරුවරුන් **විෂය අන්තගර්තය** අනුපිළිවෙල (Sequence) කර ඇත. | | | |
| (ඇ) දේශීය / ප්‍රාදේශීය පසුබිමට, (Local / Regional Context), පරිසරයට (Environment) හා **ශිෂ්‍ය අද්දැකීම්වලට ගැලපෙන ආකාරයට** ගුරුවරුන් සිසුන්ට විෂය අන්තගර්තය පවරා දෙයි. | | | |

| (ඇ) ක්‍රියාකාරකම් සැලසුම් ආශ්‍රිත අරමුණු තහවුරු වන පරිදි ගුරුවරුන් සිසුන්ට **ගෙදර වැඩ පැවරුම්** ලබා දෙයි. | | | | |
|---|---|---|---|---|
| නිපුණතා ප්‍රමිතිය | ආරම්භක නිපුණතාව (00-02) | සංවර්ධනය වන නිපුණතාව (03-04) | ඉහළ නිපුණතාව (05-06) | විශිෂ්ට නිපුණතාව (07-08) |

4. ප්‍රමිතිය 4.2.3 සඳහා නිපුණතා ප්‍රමිතිය ගණනය කරන්නේ කෙසේ ද?

| **ප්‍රමිතිය 4.2.3: සියලු ම පන්තිකාමරවල ශිෂ්‍ය කේන්ද්‍රීය ශික්ෂණවිද්‍යාව ක්‍රියාත්මක වෙයි.** | | | |
|---|---|---|---|
| **චර්යාත්මක හා භෞතික දර්ශක** | **ප්‍රදර්ශනය නොවේ** | **සංවර්ධනය වේ** | **ප්‍රදර්ශනය වේ** |
| (අ) **සිසු කියවීම දිරි ගැන්වෙන වැඩසටහන්** පාසල සංවර්ධනය කර තිබේ. | | | |
| (ආ) සියලු ම ගුරුවරුන් **කණ්ඩායම් ක්‍රියාකාරකම් ඔස්සේ සිදු වන සිසු ඉගෙනුම** අවධාරණය කරයි. | | | |
| (ඇ) තම කණ්ඩායම, වෙනත් කණ්ඩායම්, බාහිර ප්‍රජාව (සමීප හා දුරස්ථ), ගුරුවරයා වැනි **විවිධ මූලාශ්‍රවලින් ඉගෙනීමේ අවස්ථා** සිසුන්ට ඇත. | | | |
| (ඈ) සිසු කාර්යවල සම්පූර්ණ බව හා නිරවද්‍යතාව තහවුරු කිරීම සඳහා සියලු ම ගුරුවරුන් **සිසු වැඩ පරීක්ෂා කරයි.** | | | |

| නිපුණතා ප්‍රමිතිය | ආරම්භක නිපුණතාව (00-02) | සංවර්ධනය වන නිපුණතාව (03-04) | ඉහළ නිපුණතාව (05-06) | විශිෂ්ට නිපුණතාව (07-08) |
|---|---|---|---|---|
| | | | | |

5.ප්‍රමිතිය 4.2.4 සඳහා නිපුණතා ප්‍රමිතිය ගණනය කරන්නේ කෙසේ ද?

| **ප්‍රමිතිය 4.2.4: සිසුන් කෙරෙහි සැලකිලිමත් (caring), සිසුන්ට සහාය වන (supporting), ශක්තිමත් (strong) ගුරු සිසු සම්බන්ධතා උනන්දු කරමින් එම සබඳතා පාසල පුරා ප්‍රවර්ධනය කරයි.** | | | |
|---|---|---|---|
| **චර්යාත්මක හා භෞතික දර්ශක** | **ප්‍රදර්ශනය නොවේ** | **සංවර්ධනය වේ** | **ප්‍රදර්ශනය වේ** |
| (අ) හැකි සෑම අවස්ථාවක ම සිසුන්ට ප්‍රශංසා ලබා දෙමින් සිසුන් දිරිමත් කිරීම ගුරු කාර්ය භාරයේ කොටසක් බවට පත් ව තිබේ. | | | |

| | | | |
|---|---|---|---|
| (ආ)දෛනික පාසල් පැමිණීම දුවර්ල සිසුන් කෙරෙහි විශේෂ අවධානය දක්වමින් ඒ අය පාසලින් ගිලිහීම වළක්වා ගැනිම සඳහා ගුරුවරු පෞද්ගලික ව වග වෙති. | | | |
| (ඇ)සිසුන්ගේ ආරක්ෂාව කෙරෙහි ගුරුවරු සැබෑ උනන්දුවක් හා සැලකිල්ලක් දක්වති. | | | |
| (ඇ)පාසල් ඒම තමන්ට ප්‍රිය කාර්යයක් බව සිසුන් ප්‍රකාශ කරනු නිතර ඇසෙන්නට ලැබෙයි. | | | |

| නිපුණතා ප්‍රමිතිය Competency Standard | ආරම්භක නිපුණතාව Beginning Competence (00-02) | සංවර්ධනය වන නිපුණතාව Developing Competence (03-04) | ඉහළ නිපුණතාව Advanced Competence (05-06) | විශිෂ්ට නිපුණතාව Expert Competence (07-08) |
|---|---|---|---|---|
| | | | | |

6. විදුහල්පති සංවර්ධන වැඩසටහන්වලදී ප්‍රමිති පාදක ආකෘතිය ක්‍රියාත්මක වන්නේ කෙසේ ද?
ඒ ඒ ප්‍රමිතිය යටතේ හඳුනාගෙන තිබෙන **වයර්ාත්මක දශර්ක** (නව විෂයමාලා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික සූදානම සියලු ම ගුරුවරුන් ලබා ඇත) හා **භෞතික දශර්ක** (සිසුන් අතර බෙදා හැරීම සඳහා ප්‍රමාණවත් පෙළපොත් සංඛ්‍යාවක් පාසලට ලැබී ඇත) සාක්ෂාත් ව ඇති ආකාරය, ප්‍රදශර්නය නොවේ (Not Evident) / සංවර්ධනය වෙමින් පවතී (Developing) / ප්‍රදශර්නය වේ (Evident) යන මට්ටම් යටතේ හඳුනා ගෙන 00, 01, 02 ලෙස ලකුණු ප්‍රධානය

7. ඉහත ප්‍රතිඵලය යොදා ගනිමින් ඒ ඒ **නිපුණතා ප්‍රමිතිය** සාක්ෂාත් ව ඇති මට්ටම ආරම්භක අවස්ථාව (Beginning Competence – 00-02), සංවර්ධනය වෙමින් පවතින අවස්ථාව (Developing Competence – 03-04), ඉහළ මට්ටමකට සංවර්ධනය වී ඇති අවස්ථාව (Advanced Competence – 05-06), විශිෂ්ටත්වයට එළඹ ඇති අවස්ථාව (Expert Competence – 07-08) ලෙස හඳුනා ගැනීම

8. විදුහල්පතිත්ව පාඨමාලා සඳහා තෝරාගෙන තිබෙන ප්‍රමිතිය 4.2.4 ට අදාළ ව නිපුණතා ප්‍රමිතිය (Competency Standard) හඳුනා ගැනිම සඳහා සුදුසු ක්‍රමයක් ඉදිරිපත් කරන්නේ කෙසේ ද?
   - ප්‍රමිතිය 4.2.4 යටතේ වයර්ාත්මක හා භෞතික දශර්ක පෙළ ගැස්වීම
   - එම දශර්ක ප්‍රදශර්නය වන මට්ටම් හඳුනාගෙන 0, 1, 2 ආදි වශයෙන් ලකුණු ප්‍රධානය කිරීම
   - මෙම ලකුණු යොදා ගනිමින් මට්ටම් හතරක් යටතේ නිපුණතා ප්‍රමිතිය ගණනය කිරීම

9. ලකුණු ලබා දීමේ දී මධ්‍ය ලක්ෂ්‍යයක් නැති පරිමාණයක් වෙත යාම වැදගත්වන්නේ මන් ද?
පැහැදිලි විනිශ්චයක් ලබා දීමෙන් වැළකී සිටීමේ ප්‍රවණතාව ඉවත් කිරීමට සඳහා

10. එහෙත් දශර්ක සාථර්ක වූ මට්ටම් සොයා බැලීම සඳහා මේ පරිමාණය යෝග්‍ය වන්නේ මන් ද?
නිරීක්ෂණ ඔස්සේ ප්‍රදශර්නය වන තත්ත්වය හඳුනාගෙන වාතර්ා කළ හැකි නිසා

11. **චතුර් ලක්ෂ්‍ය පරිමාණයක් (Four Point Scale) සඳහා සුදුසු මට්ටම් පෙන්වා දෙන්නේ කෙසේ ද?**
   - ප්‍රදශර්නය නොවේ / ප්‍රදශර්නය වීම අරඹා ඇත / ප්‍රදශර්නය වැඩිදියුණුවෙමින් පවතී /සාථර්කව ප්‍රදශර්නය වෙයි.
   - ආරම්භක / සංවර්ධනය වන / ඉහළ මට්ටමකට සංවර්ධනය වූ / විශිෂ්ටත්වයට සපැමිණි

12. නිපුණතා ප්‍රමිතිය තීරණය සඳහා මේ පරිමාණය වඩා සුදුසු වන්නේ කෙසේ ද?

මධ්‍ය ලක්ෂ්‍ය තෝරා ගැනීම / වැට උඩ සිටීමේ ප්‍රවණතාව වැනි කාරණා පිටු දැකිය හැකි නිසා